# දුප්පත් සමාජය වතුවලට කොටුකර ඒ අයගේ ඡන්දයෙන් කොළඹ දිනන්න මට වුවමනා නෑ

## පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ කියයි

කොළඹ නගරයේ ජීවත්වන වැසියන් තවදුරටත් සාම්ප්‍රදායික ජීවිතවලට කොටු කිරීම වෙනුවට ඔවුන්ගේ අනාගතය ගොඩනැඟිය හැකි නව වැඩ පිළිවෙළක් සකස් කර ඇති අතර අප සියලු දෙනා එකතු වී සැලසුමක් අනුව ගමන් කළ යුතු බව ජනතා නිදහස් සන්ධානයේ කොළඹ නගරාධිපතිධූරාපේක්‍ෂක මිලින්ද මොරගොඩ මහතා පැවසීය.

මිලින්ද මොරගොඩ මහතා මෙම අදහස් පළකළේ උතුරු කොළඹ සමිට්පුර ක්‍රීඩාංගනයේ දී පැවැති සංවාදශීලී ජනහමුවකට සහභාගිවෙමිනි. පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්‍ෂ, පළාත් සභා මන්ත්‍රී මොහමඩ් ෆායිස්, හිටපු අමාත්‍ය ආර්.ඒ.ඩී. සිරිසේන සහ අපේක්‍ෂක රංගන පීරිස් මහත්වරු ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

මොරගොඩ මහතා මෙසේ ද කීය.

කොළඹ නගරය දියුණු කළ යුතුයි. අපි බැලුවොත් කොළඹ නගරයේ එක් එක් ප්‍රදේශවල එකිනෙකට වෙනස් ප්‍රශ්න තියෙනවා. පසුගිය ගැටුම් සහිත පරිසරය තුළ නගරයේ සංවර්ධනය අවධානයට ලක්වුණේ නැහැ. ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව සමාජයේ දැවෙන ප්‍රශ්න ගැන සිතන්නට අපට අවස්ථාව ලැබී තිබෙනවා. නැගෙනහිර හා බටහිර කොළඹ වැනි ආසනවලට වඩා උතුරු කොළඹ ප්‍රශ්න විවිධයි. දේශපාලනයෙහි නිරත වූ පසුගිය අවුරුදු දහය තුළ මම මේ ප්‍රශ්න හොඳින් දැක්කා. පාර්ලිමේන්තුවේ දී ප්‍රතිපත්ති සකස්කළ හැකියි. නගර සභාව කරන්නේ මහජනතාවට සේවයක්. පොදු පහසුකම් ලබාදීමක්. පාර්ලිමේන්තුවට පත්වන විට උතුරු කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා දිස්ත්‍රික්කයේම ජනතාවගේ නියෝජිතයා වශයෙන් ක්‍රියාකළ යුතුයි. ප්‍රායෝගිකව එය කරන්න අමාරුයි. මේ මැතිවරණ ක්‍රමය නිසා මහජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීම පහසු නැහැ. නමුත් නගර සභාව කුඩා ප්‍රදේශයකට සීමාවෙනවා. ඒ නිසා රජයට හා නගර සභාවට එකතු වී නගරය ගොඩ නඟන සැලසුමක් සකස් කළ හැකියි.

අධිරාජ්‍යවාදී යුගයේ කොළඹ නගරයේ වැදගත්ම තැන හැටියට සැලකුණේ වරාය හා ඒ අවට ප්‍රදේශ. දෙවන ලෝක යුද්ධය අවස්ථාවේ දී වැදගත්කම දෙගුණ වුණා. උතුරු කොළඹ පැවතුණ වැදගත් තැන සිට දුර්වල තැනක් දක්වා පහතට වැටිලා. දැන් තියෙන්නේ පැල්පත්. මේවායේ ජීවත්වීම පහසු නැහැ. ජනතාවට තියෙන දැවෙන ප්‍රශ්න රාශියක් ද අද වහා ඉටු කළ යුතුව තිබෙනවා. නිවාස ප්‍රශ්නය බරපතළයි. රජය සමග එකතු වී නිවාස තිස් පන්දහසක් ඉදිකරන්නට අප සැලසුම් කර තිබෙනවා. මේවා මහල් නිවාස. අවුරුදු තුනක් ඇතුළත ජනාධිපතිවරයාගේ හා රජයේ සැලසුම් අනුව මෙය ක්‍රියාත්මක කිරීම අපේ බලාපොරොත්තුවයි. මහල් නිවාසයක පදිංචියට යන්න අපි ආකල්ප වෙනසක් ඇති කර ගත යුතුයි. ඒක අභියෝගයක්. වැසිකිළි හා මල නාලිකා ප්‍රශ්න තියෙනවා.

මේ සියල්ල බලලා අලුතින් වැඩකරන්න අවශ්‍යයි. අපි සැලසුමක් අනුව වැඩ කරමු. ඉතිහාසයේ තිබුණ අභිමානවත් තත්ත්වයට උතුරු කොළඹ ගෙන එන්න හැකිවන්නේ එහෙම වුණොත් විතරයි.

දුගී දුප්පත් සමාජය දුප්පතුන් හැටියටම වතුවලට කොටුකරලා ඔවුන්ගේ ඡන්දයෙන් කොළඹ නගර සභාව දිනන්නට මට අවශ්‍ය නැහැ. ඔබ සමග මේ අවස්ථාවට පැමිණ සිටින දරුවන් ගැන බලන්න. අපි ඒ දරුවන් ගේ අනාගතය ගොඩනැඟීම අවශ්‍යයි. වත්තක දරුවෙකු ගියාම පාසලකට ගන්නේ නැහැ. පාසල අයිනේ තියෙන වත්තට පාසලේ දොරටු වැහිලා නම් එතැන ප්‍රශ්නයක් තියෙනවා. මේ ගැන අපි බලන්න අවශ්‍යයි. අවුරුදු හැට හැත්තෑවක් එකම ආකාරයට ජීවත් වූ ජනතාව මේ සාම්ප්‍රදායික ජීවිත වලින් ඈත් කර අලුත් ජීවිතයක් දිය යුතුයි. වත්ත වෙනුවට අලුත් සංස්කෘතියක් අපි ගොඩනගන්න සැලසුම් කර තිබෙනවා. ඒක දියුණුව. හැමදාම වත්තක ඉන්න පුළුවන් ද? තමන්ට කියා ජීවිතයක් තමන්ගේ දරුවන්ට අනාගතයක් ගොඩනගන්නට අපි සැලසුම් සකස් කර අවසානයි.



වැඩපිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. එය කතිකාවතක්. දින සියයකින් අපිට වැඩ කරන්නට හොඳ පදනමක් සකස් කරගන්න සූදානම්කර තිබෙනවා. ඒ අනුව අප සමග අදහස් හුවමාරු කරගෙන එක්සත් ජනතා නිදහස් සන්ධාන නගර සභාවක් කොළඹට පළමු වතාවට පත් කරන්නට එකතු වන්නැයි ද හෙතෙම මෙහිදී ඉල්ලා සිටියේය.